GMOA
ESTABLISHED IN 1926
TU No. 291
THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07
Tel : 2580886 / 0714 999555
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

2014/09/15

## මාධ්‍ය නිවේදනයයි

රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ වාර්ෂික නිලවරණය පසුගිය ජූනි මාසයේ පැවත්විණි. වසර කිහිපයක් තිස්සේ වෛද්‍යවරුන් කිහිපදෙනෙක් විසින් (බහුතර සාමාජිකත්වය විසින් ප්‍රතික්ෂේපිත) මෙම නිලවරණය කඩාකප්පල් කිරීමට උත්සාහ දරණ ලදි. නමුත් ඒ සියලු උත්සාහයන් ව්‍යර්ථ කරමින් වෛද්‍ය අනුරුද්ධ පාදෙනිය මහතා ඇතුලු කණ්ඩායම අතිමහත් බහුතරයකින් 4 වන වතාවටත් සංගමයේ බලයට පත්විය. මෙවර අන් කවරදාටත් වඩා ඉහත කී කඩාකප්පල්කාරී කණ්ඩායම විසින් අධිකරණ ක්‍රියාමාර්ග හරහා රජයේ වෛද්‍ය නිළධාරීන්ගේ සංගමය අකර්මන්‍ය කිරීමට නැඹුරුවක් දැක්වීය.

ඔවුන් ඒකපාර්ශවිකව ලබාගත් වාරණ නියෝගයක ප්‍රතිඵලයක් ලෙස පසුගිය ජූලි මාසය පුරාම රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ කාර්‍යාලය වසා දමා එහි විධායක මණ්ඩලයටද සිය රාජකාරී වලින් වැලකී සිටීමට සිදුවිය. එපමණක් නොව අධිකරණයට අපහාස කිරීමේ සාවද්‍ය චෝදනාවක පටලවා සංගමයේ සභාපති විශේෂඥ වෛද්‍ය අනුරුද්ධ පාදෙනිය මහතා සහ මැතිවරණ කමිටුව සිරගත කිරීමට පවා කුමන්ත්‍රණයක් දියත් විය.

කෙසේ වෙතත් රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය වෙනුවෙන් පෙනී සිටි නීතිඥවරුන් නිවැරදි ලෙස කරුණු දැක්වීමේ ප්‍රතිඵලයක් ලෙස එම වාරණය නිකුත් කල අධිකරණය විසින්ම ඉවත් කරන ලදි තවද එම වාරණය ලබා ගෙන ඇත්තේ සාවද්‍ය කරුණු ඉදිරිපත් කරමින් සහ අධිකරණ ක්‍රියාදාමය අනිසි ලෙස යොදා ගනිමින් බවද තීන්දු විය. පසුගිය මාස 03 ක පමණ කාලයක් තුල රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයට විරුද්ධව ගොනු කල නඩු 06 කට මුහුණ දීමට සංගමයේ සාමාජික මුදල් රුපියල් ලක්ෂ 80ක පමණ මුදලක් වියදම් වී ඇති අතර තවමත් එම නඩු අවසන් වී නොමැත. ඉදිරියේදී තවත් කොපමණ මුදලක් වැයවේ දැයි තක්සේරු කිරීමට පවා අපහසුය. සංගමයට විරුද්ධව මෙම නඩු ගොනු කල කඩාකප්පල්කාරීන්ට මේ සඳහා රුපියල් ලක්ෂ 100කට අධික මුදලක් වැය වී ඇති බවට තොරතුරු ලැබී තිබේ. මොවුන්ට මේ සඳහා මුදල් ලැබෙන්නේ කවර මාර්ගයකින්ද යන්න පිළිබඳව සැක පහල වී තිබේ. නමුත් එක් කාරණයක් පැහැදිලිය එනම්, රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය විනාශ කර දැමීමට යම් කිසි බාහිර බලවේගයක් හෝ කිහිපයක් මොවුන්ව මෙහෙයවන බවය.

මෙම හානිකර කණ්ඩායමට එරෙහිව සංගම් ව්‍යවස්ථාවෙන් නියම කර ඇති පරිදි විනය ක්‍රියාමාර්ග වහාම ගත යුතු බව සාමාජිකයින් 7000ක් පමණ අත්සන් කල පෙත්සමකින් ඉල්ලා ඇත. එසේම රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ භාරකාර මණ්ඩලය ඉල්ලා සිටින්නේද මෙවැනි විනාශකාරී පුද්ගලයින් සංගමය තුල රඳවා නොගත යුතු බවය. එපමණක් නොව මැතිවරණ කමිටුවේ රාජකාරී වලටද එම කඩාකප්පල්කාරීන් දැඩි බාධා එල්ල කර ඇත. එබැවින් මැතිවරණ කමිටුව ප්‍රකාශ කොට ඇත්තේ මෙම හානිකර පුද්ගලයින් රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයෙන් ඉවත් නොකරන්නේ නම්, ඉදිරියේදී තමන් මැතිවරණ රාජකාරි වලට සහභාගී නොවන බවය.

මෙම සියලු බලපෑම් හමුවේ රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ විධායක සභාව කඩාකප්පල්කාරී වෛද්‍යවරුන් කිහිපදෙනා සම්බන්ධව තීරණය කිරීම සඳහා මධ්‍යම කාරක සභාවට යොමු කර ඇත. දිවයින පුරා ශාඛා 90කින් පමණ සමන්විත, මධ්‍යම කාරක සභාව විසින් ඒකමතිකව තීරණය කර ඇත්තේ මොවුන්ට විරුද්ධව දැඩි විනය ක්‍රියාමාර්ග ගත යුතු බවය. ඒ සඳහා දැනට විනය කමිටුවක්ද පත් කර ඇත. එම කමිටුව විසින් දැනටමත් අදාල චූදිතයින්ට චෝදනා පත්‍ර සකස් කරමින් පවතී.

මසක පමණ කාලයක් සංගමය වාරණය කර තිබීම හරහා සෞඛ්‍ය සේවයේ ගන්නා ලද වැදගත් තීන්දු තීරණ රැසකට රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයට දායක වීමට තිබූ අවස්ථාව අහිමි විය. සෞඛ්‍ය සේවයේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සඳහා රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය දියත් කර තිබූ පුහුණු වැඩ සටහන් ගණනාවක් අත්හිටුවීමට සිදුවිය. සාමාජිකත්වයේ සුභ සාධනය වෙනුවෙන් ආරම්භ කර තිබූ ව්‍යාපෘති ගණනාවක් අඩාල විය.

එබැවින් සංගමය වාරණය කිරීමෙන් සාමාජිකත්වයට සිදු වූ පීඩාව සහ සංගමයට සිදු වූ අපකීර්තිය වෙනුවෙන් රුපියල් මිලියන 500 ක වන්දියක් ඉල්ලා හරස් ඉල්ලීමක් පසුගියදා ගොනු කරනු ලැබීය. එමෙන්ම පසුගිය ජූලි මාසයේදී සිදුකලාක් මෙන් ඉදිරියේදීද මෙම කඩාකප්පල්කාරීන් රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ ගැලවුම්කරුවන් මෙන් මාධ්‍ය ඉදිරියේ පෙනී සිටීමට ඉඩ තිබෙන බැවින් ඒ පිළිබඳව දැනුවත්ව කටයුතු කරන මෙන් වගකීමෙන් කටයුතු කරන මාධ්‍ය ආයතන වලින් මෙයින් ඉල්ලා සිටිනු ලැබේ.

ස්තුතියි,

වෛද්‍ය ලසන්ත පිනදාස
ලේකම්

වැඩිදුර විස්තර සඳහා : වෛද්‍ය නලින්ද හේරත් - 0773495821